# 13
# ක්‍රිස්තුස් වහන්සේ තුළ පවුල

ලෝකය තුළ පවුල් ඒකකයට ඉතා වැදගත් ස්ථානයක් හිමි වේ .අද සමාජයේ මිනිස් සම්බන්ධතා න්‍යාෂ්ටික පවුල, විස්තෘත පවුල, ආගමික සබඳතා ඇතුළත් පරිසරය හා සමාජීය විශ්වීය පරිසරය තුළ ගොඩනැංවී තිබේ. ශ්‍රී ලාංකීය සමාජ සංස්කෘතිය අතීතයේ දී විස්තෘත පවුල මත ගොඩනැගී තිබුණත් අද එය බොහෝ දුරට න්‍යෂ්ටික පවුල් ඒකක මත ගොඩ නැගී ඇත.

දෙවියන් වහන්සේගේ මැවිල්ල දෙස බලන කල පවුල් ඒකකය, ඉතා වටිනා, වගකීම් දරන, නව ලෝකයක් බිහි කිරීම සඳහා දෙවියන් වහන්සේ නිර්මාණය කළ දෙයක් බව වැටහේ. කිතුනු පවුලක් ක්‍රිස්තුස් වහන්සේගේ නායකත්වය මඟ පෙන්වීම හා වැඩ විසීම තුළ ගොඩනැංවූ දෙයකි.

## කිතුනු පවුල

1. පවුලේ නිර්මාතෘවරයා දෙවියන් වහන්සේ යි. ඒ නිසා පවුල පිළිබඳ ව එතුමන්ගේ බලාපොරොත්තුව තේරුම් ගැනීමට උත්සාහ කළ යුතු ය. කොලොස්සි 3 : 18 21 ස්ත්‍රිය හා පුරුෂයා දේව ස්වරූපය අනුව නිර්මාණය කරනු ලැබ පවුල් ඒකකය තුළ (උප්පත්ති 1 : 27 28, 2 :24 ) ජීවත් වන්නට ඉඩ සලසනු ලැබිණි. එය සමාජයේ මුල් ම පුරුකයි. එම නිසා දෙවියන් වහන්සේගේ අභිලාෂයන් සම්පූර්ණ වන කිතුනු පවුල් නිර්මාණය වීම හා පැවතීම අවශ්‍ය ය. එය මිනිස් හැකියා බලපෑම්වලින් නිර්මිත දෙයක් නොවිය යුතු ය. දෙවියන් වහන්සේගේ අතින් නිර්මාණය වීමට ඉඩ සැලසිය යුතු ය.

2 කිතුනු පවුල් ඒකක තුළ එතුමන් හා සබඳතා පවත්වා ගැනීමට නිරන්තර අවස්ථාව හා අවකාශ තිබේ. ආදම් හා ඒව මිනිස් පවුල් සංකේතවත් කරන අතර දෙවියන් වහන්සේ ඔවුන් සමඟ සංවාදයේ යෙදුනු බව. ( උත්පත්ති 3 : 9 13 ) පෙනේ.

3. කිතුනු පවුලක් දෙවිඳුන් සමඟ තබන සබඳතාවයේ ශක්තිමත්භාවය එකිනෙකා අතර සබඳතා ආරක්ෂා වීමට ඉවහල් වෙයි.පවුලේ සියලු ම අවස්ථාවල දී (තීරණ,අනාගත සැලසුම්, පවුලේ ගැටළු සහගත අර්බුදකාරී හා ප්‍රීතිමත් සහභාගිත්වයෙන් ගොඩනංවන අවස්ථා ) දේව වචනය මත පිහිටමින් එකිනෙකාට ගරු කරමින් දෙවිඳුන් සමඟ සම්බන්ධයෙන් යුතුව ගමන් කළ යුතු ව තිබේ.

4. කිතුනු පවුලක් සම්බන්ධ ව දෙවිඳුන්ගේ කැමැත්ත කුමක් ද? (උත්පත්ති 1 ඃ 28) වර්ධනය වෙමින්, ලෝකය රැකබලා ගනිමින්, ලෝකය වගකීමකින් යුතු ව ගොඩනැංවීම යි. දෙවිඳුන් රජයන යහපත් ලොවක් බිහිකිරීමේ ක්‍රියාවලිය තුළ සමාජයේ මුල් ම පුරුක වන පවුල ඉතා වැදගත් තැනක් ගනී. එම නිසා කිතුනු පවුල් ඒකක සමාජය තුළ ක්‍රියාශීලි වගකීමකින් යුතු ව ක්‍රියා කරන ඒවා විය යුතු ය.

## පවුල තුළ සම්බන්ධතා

### 1. ජේසුස් වහන්සේ හා පවුල් සම්බන්ධතාවය

යහපත් කිතුනු පවුල් ඒකකයක් බිහිවීමට එකිනෙකා අතර පවතින සම්බන්ධතා ඉතා වැදගත් ස්ථානයක් දරයි. ජේසුස් වහන්සේ පවා මිනිස් පවුලක් තුළ විසූ නිසා( ජෝසෙප්, මරියා සහෝදරයන් සමඟ) මිනිස් පවුලක අගය වඩා කැපී පෙනේ. කුරුසය මත දිවි පුදන විට පවා තම මව ගැන සොයා බැලූ ආකාරය අපට මහත් අභියෝගයක් ගෙනෙයි. මරියාතුමිය තම ඥාතින් සමඟ තැබූ සබඳතා ද අපට ආදර්ශයකි. කුරුසියේ දී පවා ජේසුස් වහන්සේ මරියා, ජොහාන් යන දෙදෙනා එකිනෙකාට භාරදුන් බව පෙනේ. (ශු ජොහාන් 19 ඃ 26 27 )සමාජය තුළ එක පවුලක් යන හැඟීම තිබීම වැදගත් බව මින් පෙන්නුම් කරයි.

වරක් එතුමාගේ සහෝදරයන් සමඟ පවුලේ අය එතුමන් සොයා ආහ. එවිට එතුමා " දෙවිඳුන්ගේ කැමැත්ත ඉටුකරන කවරෙක් හෝ වෙත්වා ඔවුහු මාගේ සහෝදරයාත් සහෝදරියත් මෑණියොත්. " යැයි වදාළ සේක. (මතෙව් 3:31 35 ) මේ මඟින් ලෝකය තුළ පවතින සම්බන්ධතාවල සීමාසහිතභාවය ඉක්මවමින් පුළුල් සම්බන්ධතා ඉලක්ක කර පෙන්වූ සේක.

### 2. අඹු සැමි සම්බන්ධතා

විවාහය තුළ අඹු සැමි සම්බන්ධතාවය දෙවිඳුන් විසින් ඇතිකරන ලද්දකි. (උත්පත්ති 2 ඃ 24 , මතෙව් 19 ඃ 5 6 , මාක් 10 ඃ 6 9, එපීස 5 ඃ 31 32 ) එහි ගෞරවනීයත්වය හා උතුම් භාවය ක්‍රිස්තුස් වහන්සේ හා සභාවට එය ආදේශ කිරීමෙන් පෙනී යයි. විවාහය තුළ එකිනෙකා අතර පවතින සම්බන්ධතා වගකීමකින් යුතු ව දැරීම හා සුරක්ෂිත ව තබා ගැනීම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙහි ම යුතුකමකි. ප්‍රේමය පිරුණු පවුලක් ගොඩනැගීම දෙවිඳුන්ගේ අභිලාෂය යි.

### 3. දෙමාපියන් හා දරුවන්

මව පියා අතර පවතින සම්බන්ධතාවය දරුවන්ට නිරන්තරයෙන් මහත් බලපෑම් ඇති කෙරේ. මව හා පියා එක්සත් ව සාමකාමී ව දෙවිඳුන් පාමුල දේවභය සහිත ව තම ගෙදර ගොඩනැංවීම කළ යුතු ය. එකිනෙකාට ගෞරව කළ යුතු ය. ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා හිංසන ක්‍රියා අනුගමනය නොකළ යුතු ය.





අප පවත්වන සමාජයේ යම් යම් අර්බුදකාරී අයහපත් තත්ත්ව මත කැඩුනු විවාහ, කැඩුනු දෙමාපිය සම්බන්ධතා පවතින අවස්ථා තිබේ. මේ අවස්ථා පවුල් ඒකකය තුළ ජීවත් වන දරුවන්ගේ පෞරුෂත්වයට ඉතා අයහපත් වාතාවරණයක් හා බලපෑමක් ඇති කරනු ලබයි. මෙවන් අවස්ථාවලදී දරුවන් ද වගකීමෙන් යුතු ව පවුල් තුළ එකිනෙකා රැකබලා ගනිමින් පවුල ගොඩනැංවීමට හැකි සෑම උත්සහයක් ම දැරිය යුතු ය. එවැනි දෙමාපියන් පවුල හා දරුවන් සම්බන්ධ ව තම වගකීම වටහා ගත යුතු ය. පවුලේ යහපත උදෙසා ක්‍රියා කිරීම දෙවිඳුනගේ ආරක්ෂා ව බව තේරුම්ගත යුතු ය. එකිනෙකාට සංවේදී ව තම ගැටළු නිරාකරණය කරගැනීමට උනන්දු විය යුතු ය.

දේව රාජ්‍යයට පිවිසුමට ළදරුවන් වාගේ වීම අවශ්‍ය බව ජේසුස් වහන්සේ පැවසූ සේක. දරුවන් තුළ දේව රාජ්‍යයට අයත් යහපත් ගුණාංග පවතින බව තේරුම් ගත යුතු ය. එසේ ම දරුවන් දෙමාපියන් මත යැපෙන බව වටහා ගෙන ඒ වගකීම සම්පූර්ණ කළ යුතු ය.


පවුලක දරුවන් දෙවිඳුන් ලාබදෙන තිළිණ සේ සැලකිය යුතු ය. දූ දරුවන් හා පුතුන් දේව ස්වරූපය අනුව මවා තිබෙන නිසා එකිනෙකාට ගෞරවයෙන් සලකන්නටත් එක සමාන ලෙස ජීවත් වීමටත් ගැලපෙන වාතාවරණයක් තිබිය යුතු යි.

(ගැහැණු දරුවන් හා පිරිමි දරුවන්ට නිවෙස්වල දී සලකන පිළිවෙළ එක සමාන ද? වෙනස්කම් තිබේ ද? එසේ සිදුවන්නේ ඇයි? සිදුවිය යුත්තේ කෙසේ ද? සාකච්ඡා කරන්න.)

## 4. සහෝදර සහෝදරියන් අතර පැවැතිය යුතු සබඳතා

පවුලක පවතින සහෝදර බැම්ම ඉතා වටිනා එකකි. ශ්‍රී ලාංකික සංදර්භය තුළ ජීවිතාන්තය දක්වා මේ සම්බන්ධතාව පවත්වා ගැනීමට උත්සුක වේ. වැඩිහිටි සහෝදර සහෝදරියන් හා බාල සහෝදර සහෝදරියන් එකිනෙකා රැක බලා ගැනීම, ප්‍රීතිමත් කිරීම හා එකිනෙකාට ගෞරව කිරීමත්, තේරුම් ගැනීමත් අවශ්‍ය ය. අප සමාජයේ මව හා පියා නොමැති අවස්ථාවල දී වැඩිමහල් සොයුරු සොයුරියන් බාලයන් ව රැක බලා ගැනීම සිදු වේ. එහෙත් එය ගෝලීයකරණයට හසුව තිබෙන සමාජයේ තුනී වෙමින් පවතී. සහෝදරත්වය තම

පවුල් සීමාවන් ඉක්මවා යායුතු බවට අභියෝගයක් ඇත. (මතෙව් 3 ඃ 31 35 ) ඔබේ පාසලේ , ලෝකය තුළ සහෝදරත්වය අහිමි වී තිබෙන අය ගැන ඔබේ වගකීම තේරුම් ගෙන තිබේ ද? " ඔබේ සහෝදරයා කොහේ ද? " (උප්පත්ති 4 ඃ 9 ) දෙවිඳුන් අපගෙන් අසන විට අප දෙන පිළිතුර කුමක් ද? විවිධ තත්ත්වවල සිටින ඔබේ සහෝදර සහෝදරියන් ගැන කිතුනු ප්‍රේමයෙන් කටයුතු කිරීමට ඔබට වගකීමක් තිබේ.



## කිතුනු පවුලක පැවැත්ම ............

කිතුනු පවුලක පදනම ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ය. මුදල් මත පදනම් ව ගොඩනැගෙන පවුල කිතුනු පවුලක ආදර්ශය නොවේ. එසේ ම පවුලේ වර්ධනය, අභිවෘද්ධිය, ඉදිරි ගමන සඳහා සැලසුම් දේව පනතට අනුව දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති අනුව ඒ මත පැවතිය යුතු වෙයි. විශේෂයෙන් විවාහය සම්බන්ධ පදනම පවුලේ තත්ත්වය, කුලය, දැවැද්ද, වර්ණය හා ජාතිය නොවිය යුතු අතර ඒවා ඉක්මවා යමින් ප්‍රේමයේ ගැඹුරු අර්ථයන් තුළ දී ම දේවරාජ්‍යයේ ගුණගරුකභාවය සාක්ෂාත් කරන අවස්ථා කරා අවතීර්ණ වීමට මඟ පෙන්වීම ලැබිය යුතුයි. මෙවන් පවුල දෙවියන් වහන්සේගේ කැමැත්ත ලොව ඉටු කරමින් නව ලොවක් බිහිකිරීමට දායක වන්නේ ය.

කිතුනු පවුලක සාමාජිකයන් තම කුඩා පවුල් ඒකකයට අමතර ව තමා හා සම්න්ධ ව සිටින ඉන් එහා සමාජය ගැන ද වගකීම් දැරීම කළ යුතු ය. අද ලෝකය තුළ විස්තෘත පවුල් ක්‍රමය මියැදෙමින් පවතී. අප රටේ සංස්කෘතියේ අතීතයේ "පවුල්" ගොඩනැගී තිබුණේ විස්තෘත පවුල් ක්‍රමය තුළ ය. " මව , පියා , දුව පුතාට අමතර ව ආච්චී , සීයා , නැන්දා, මාමා , මහම්මා මහප්පා ඇතුළු බොහෝ දෙනෙක් එකට එක් ව ජීවත් වූහ. මෙම විස්තෘත පවුල තුළ දරුවන් වෙනුවෙන් කාලය ගතකිරීම ආදරය දැක්වීම හා ඔවුන් රැකබලා ගැනීම සිදු විය. විවිධ ජාතීන් අතරේ සහජීවනයෙන් ජීවත් වීමට පුහුණුවක් ද ඉන් ලැබේ.

සමාජ සාරධර්ම හා සංස්කෘතික අගයන් ඉදිරියට ගෙන යෑමට විස්තෘත පවුල් සැම විට ම සමාජ මෙහෙවරක යෙදේ. එසේ ම සමාජයේ දෙමාපියන් සෙනෙහස හා පවුලේ උණුසුම අහිමි වූ දරුවන් වෙත ප්‍රේමයේ ඉම් කණු පළල් කිරීම කරා කිතුනු පවුල් අද දයාවෙන් විසල් වෙමින් ව්‍යාප්ත වීම අවශ්‍ය ව තිබේ.

මෙසේ ක්‍රිස්තුස් වහන්සේ මූලිකයා හා මඟ පෙන්වන්නා ව සිටින යහපත් කිතුනු පවුල් ජීවිත ගොඩනැංවීම තුළින් ලෝකය සම්බන්ධ ව දෙවිඳුන්ගේ අභිලාෂ පූර්ණ කිරීමට මඟපෑදීමක් වන අතර ම එකිනෙකා සමඟ සහජීවනයෙන් ජීවත් වීමට එය මූලික අත්තිවාරමක් ද වේ.



❖ **ඇගැයීම :-**

1. පහත සඳහන් ප්‍රකාශය පවුලක අභ්‍යන්තරික ජීවිතයට කුමන අභියෝගයක් ගෙනෙයි ද?
   " ක්‍රිස්තුස් වහන්සේ මේ නිවසේ මූලිකයා හා නිහඬ සවන් දෙන්නා ය"
   ඔබේ පවුල උදෙසා නව පාඨයන් සකස් කරන්න.

2. ඔබගේ පවුලේ සබඳතා දියුණු කර ගැනීමට ඔබට කළ හැකි දේ පහදමින පවුලක් තුළ පැවතිය යුතු වගකීම් හා යුතුකම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගන්න.